# දැන් ඉතින්

විජාතික බලවේගබල උපක්‍රම, දීමනා, පොරොන්දු ආදී සියල්ල පරදා ආණ්ඩුව අයවැය විවාදය ජයගත්තේ ය. එහි දී නැවත වරක් ජාතික බලවේග එක්සත් ව තම ශක්තිය ප්‍රදර්ශනය කෙළේ ය. වෙනත් ආකාරයකින් කියන්නේ නම් පනස්හයේ දරුවෝ නැවතත් ජයගත්හ. පනස්හයේ දරුවෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ද , ජනතා විමුක්ති පෙරමුණේ ද, මහජන එක්සත් පෙරමුණේ ද, ජාතික හෙළ උරුමයේ ද වෙති. අප කලින් ද කියා ඇති පරිදි බණ්ඩාරනායක මහත්ම මහත්මීන්ගේ දරුවෝ පනස්හයේ දරුවෝ නො වෙති. අනුර බණ්ඩාරනායක මහතා තවත් වරක් පෙන්නුම් කෙළේ ඔහු පනස්හයේ දරුවකු නොවන බව ය. අයවැය දෙවැනිවර කියවීමේ දී තම දෙමව්පියන් වෙනුවෙන් ඡන්දය දෙන බව කී බණ්ඩාරනායක මහතා තුන්වැනිවර කියවීමේ දී දෙමව්පියන් වෙනුවෙන්වත් ඡන්දය නො දුන්නේ ය.

මේ ආණ්ඩුවත් සමග විජාතික බලවේග ජන්මාන්තර වෛරයකින් පසුවන බව රහසක් නො වෙයි. එයට හේතුව ඊනියා මානව අයිතිවාසිකම් කඩවීම්වත්, මාධ්‍ය නිදහස නැතිවීමවත්, වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී යැයි කියන අයිතියක් පැහැර ගැනීමවත්, වෙනත් එවැන්නක්වත් නො වෙයි. විජාතික බලවේගවල ප්‍රධාන කොටසක් වූ බටහිර රටවල් විසින් ලෝකයේ නම් දැරූ ඒකාධිපති පාලකයෝ  ආරක්ෂා කරනු ලැබූහ. ඒ අවස්ථාවල ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයක් ඒ රටවලට මතක් නො වී ය. අනෙක් අතට රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයක් බලාපොරොත්තු වීම ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලීමක් වැනි ය.

අද විජාතික බලවේගවල ප්‍රධානියකු වූ ද, පනස්හයේ දරුවකු නොවූ එහෙත් බණ්ඩාරනායක දරුවකු වූ සුනේත්‍රා බණ්ඩාරනායක  මහත්මියගේ හිටපු සැමියකු වූ ද කුමාර් රූපසිංහ මහතා ප්‍රයත්න නම් ව්‍යාපෘතියක් අරඹා ඇත. මේ ව්‍යාපෘතිය ඒ මහතාගේ පෞද්ගලික ධනයෙන් පවත්වාගෙන යන්නක් නම් නො වෙයි. ඒ මහතාගේ ප්‍රයත්නය මේ ආණ්ඩුව පෙරළා දැමීමට ය. ඒ දේශපාලන ව්‍යාපෘතියකි. අද ජාතික බලවේගවල කාර්යභාරය විය යුත්තේ කුමාර් රූපසිංහ මහතාගේ මේ ප්‍රයත්නය අවසාන ප්‍රයත්නය බවට පත්කර ඒ පරාජය කිරීම ය.

විජාතික බලවේග අද ආණ්ඩුවර විරුද්ධව කටයුතු කරන්නේ එකම එක කරුණක් නිසා ය. ඒ කොටි පරාජයකිරීමට ආණ්ඩුව කටයුතු කරන බැවින් ය. බටහිර රටවල් කොටි තහනම ගැන කුමක් දෙඩෙව්වත් ඒ කොටි ඇමරිකන් විරෝධී මුස්ලිම් ත්‍රස්තවාදී සංවිධාන සමග ඇති යම් යම් සම්බන්ධකම් නිසා කෙරෙන්නකි. එසේ නැතිව කොටි ලංකාවේ ත්‍රස්තවාදී ක්‍රියාවල නිරතවීම නිසා බටහිරයෝ කොටි තහනම් නොකරති. තහනම් කෙරී ඇතැයි කියන කොටින්ට එංගලන්තයේ ඔස්ට්‍රේලියාවේ පෙළපාලි පැවැත්වීමට නිදහස ඇත. ඒ පෙළපාලිවලට ඒ රටවල ඉඩ දෙන්නේ බටහිරයන්ට අවශ්‍ය දේ කොටි ලංකාවේ දී කරන බැවිනි.

කොටි සංවිධානය අද පවත්වාගෙන යනු ලබන්නේ බටහිර රටවල් හා ඒ රටවල වෙසෙන දෙමළ ජනයා විසිනි. බටහිර රටවල් විසින් එදා සිටම දෙමළ ජාතිවාදය යොදාගනු ලැබුයේ  සිංහලයන්ට විටැද්ධව ය. සිංහලයන්ට විරුද්ධවීම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි එක් අංගයකි. සිංහල සංස්කෘතිය අවසාන විශ්ලේෂණයේ දී බටහිර රටවලට ඇති ප්‍රධානම තර්ජනයක් වෙයි. සිංහලයන් ඒ බව නොදනිතත් වටහිරයෝ ඒ බව හොඳාකාරවම දනිති. එවැවින් සිංහල සංස්කෘතිය නැතිකිරීම, අඩුම තරමින් එය දුර්වල කිරීම බටහිරයන්ගේ අරමුණ වෙයි. ඒ කාර්යයෙහි දී බටහිරයෝ කොටි සංවිධානය ප්‍රයෝජනයට ගනිති.

එවැනි කොටි සංවිධානය පරාජය කිරීමට බටහිරයෝ අකමැති වෙති. එබැවින් බටහිරයෝ කොටි පරාජයකිරීමට කටයුතු කරන ආණ්ඩුවට විරුද්ඃධ වෙති. ඔවුහු ඒ ආණ්ඩුව පරාජය කිරීමට කටයුතු කරති. පසුගිය සති කිහිපයෙහි අප අත්දුටුවේ බටහිරයන් තමන්ට හුරු පුරුදු රාජ්‍ය තන්ත්‍රික ක්‍රම යොදා ආන්ඩුව පරාජය කිරීමට දිවා රෑ නොමලා කටයුතු කළ අන්දම ය.

හකීම් මහතා අන්තිම මොහොතේ තමා කවුදැයි හෙළිදරවු කෙළේ ය. එහෙත් ඔහු හෙළිදරවු වූයේ ඔහු ගැන නොදත් අයට මිස දත් අයට නො වේ. හකීම් මහතාට නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයා ගැන අවබෝධයක් හෝ උනන්දුවක්

© Prof. Nalin De Silva

හෝ නැත. ඔහු දන්නේ කොළඹ හා මහනුවර වෙසෙන මුස්ලිම් ජනයාගේ අතැම් ප්‍රශ්න ය. හකීම් මහතා මතට නායකත්වය කඩා වැටුනේ අෂ්රොෆ් මහතාගේ හදිසි අභාවය නිසා ය. ඒ හැරෙන්නට ඔහුට ජනතාවගේ සිත් ඇදගත් ප්‍රතිපත්තියක් නැත. හකිම් මහතා පාර්ලිමේන්තුවේ ඒ පැත්තෙන් මේ පැත්තටත් මේ පැත්තෙන් ඒ පැත්තටත් යන්නේ තම සගයන් කිහිප දෙනකු  ඉතිරි කර ය. ඔහුට තම පාර්ලිමේන්තු කණ්ඩයමටවත් නායකත්වය දිය නොහැකි බව පැහැදිලි ය.

තොණ්ඩමාන් මහතා ද සිටින්නේ එළි පත්තේ ය. කොයි මොහොතේ ඔහු ආණ්ඩුවෙන් ඉවත් වේ දැයි කිව නො හැකි ය. එ ජා පක්‍ෂයට ආණ්ඩුවක් පිහිටුවීමට හැකිනම් තොණ්ඩමන් මහතා මේ ආණ්ඩුව පෙරළා දැමීමට තම ඡන්දය යොදා ගනු ඇත.  ආණ්ඩුව තොණ්ඩමන් මහතා ගැන විශ්වාසයක් පවත්වාගෙන යන්නේ යැයි නො සිතමු. එහෙත් ආණ!ඩුව කිසිම වූ ගෞරවයක්  ද තොණ්ඩමන් මහතාට දැක්විය යුතු නො වේ. තම ජනතාවට කරන ඊනියා සේවය යැයි කියමින් බලයේ රැඳී සිටීම ඒ මහතාගේ ප්‍රතිපත්තිය වෙයි. ඔහු මූලික වශයෙන් ඉන්දියාවට අවශ්‍ය දේ කරයි. අද ඉන්දියාව සෝවියට් දේශය පැවති කාලයේ දී තිබි ඉන්දියාව නො වෙයි. අද ඉන්දියාව ද කොකා කෝලා සංස්කෘතියෙහි වෙයි. එබැවින් අවසානයේ දී තොණ්ඩමන් මහතා ද ක්‍රියා කරන්නේ බටහිර ක්‍රිස්තියානි රටවලට අවශ්‍ය ආකාරයට ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සියළු බලවේග පැරදවීමට ආණ්ඩුවට හා ජාතික බලවේගවලට හැකිවීම ජාතිකත්වයේ ජයග්‍රහණයකි. මෙදා අයවැයෙන් ආරක්‍ෂක අමාත්‍යාංශයට ගියවර වෙන්කළ මුදල මෙන් දෙගුණයක් වෙන් කෙරී ඇත. මේ මුදල් වෙන්කිරීමට විරුද්ධ වන්නෝ සිංහල විරෝධියෝ ය. දෙමළ ජාතිවාදීහු ය. බොරු සාමයක් ගැන කතාකරමින් කොටින්ට අවශ්‍ය දේ ලබාදීමට කටයුතු කරන්නෝ ය. එහෙත් සිංහල ජනතාවගේ අතිවිශාල බහුතරය පමණක් නොව බොහෝ දෙමළ ජනයා ද ආරක්‍ෂක අමාත්‍යාංශයට වැඩි මුදලක් වෙන්කිරීම ගැන විරුද්ධ නො වෙති. අද ආණ්ඩුව කළ යුත්තේ ඒ මුදල් නාස්ති නොකර කොටි මුළුමනින් ම පැරදවීමට කටයුතු කිරීම ය. ඒ සඳහා දැනටමත් සැලැස්මක් නැතැයි අපි නො කියමු. සැලැස්මක් ඇතත් ආණ්ඩුවේ ඇතැමුන්ගේ ක්‍රියාකාරකම් ඒ සැලැස්මට පිටින් යයි. අඩුම තරමින් දූෂණ අවම කිරීමට ආණ්ඩුවට ක්‍රමවේදයක් තිබිය යුතු ය. සැලැස්මක් තිබිය යුත්තේ හමුදා කටයුතුවල දී පමණක් නො වේ. සිවිල් කටයුතු වල දී ද සැලැස්ම තිබිය යුතු ය. ජනතාව ආරක්‍ෂක අමාත්‍යාංශයට මුදල් වෙන්කර දී ඇත්තේ අමාරුකම් මැද බව ආණ්ඩුව වටහාගත යුතු ය. ආණ්ඩුව ජනතාවගේ මේ ප්‍රතිපත්තිය අගය කළ යුතු ය. එහෙත් ඒ අගයකිරීම දූෂණ හා වෙනත් අක්‍රමිකතාවල යෙදෙන්නන් අතින් නොවිය යුතු ය.

ජනතාව හැමදාමත් ආණ්ඩුවට කල් නොදෙනු ඇත. කාල නිර්ණයක් නිශ්චිතව කළ නොහැකි වුව ද අවුරුද්දක පමණ කාලයක දී මේ කටයුතු බොහොමයක් කළ හැකි වෙයි. අඩු තරමින් ඒ සඳහා එක් පියවරක් නොව පියවර කිහිපයක් ඉදිරි අවුරුද්දෙහි ගත යුතු ය. එසේ නොවන්නට ආණ්ඩුව විජාතික බලවේගවලට හිස එසවීමට අවස්ථාව ලබා දෙනු ඇත. එය ආණ්ඩුවේ පමණක් නොව රටේ ස්වෛරීභාවයේ ද අවසානය වනු ඇත. එසේ වුවහොත් රට සියවස් භාගයකින්වත්  ආපස්සට යනු ඇත.

රට සංවර්ධනය කිරීමට කොටි පරාජය කර අවසන් වන තුරු සිටිය යුතු නො වේ. ආණ්ඩුව ද ඒ බව දනියි. සංකල්පීය ව ගත්කල එහි ප්‍රශ්නයක් නැත. එහෙත් ක්‍රියාත්මක වීමේ දී යම් ප්‍රශ්න ඇත්නම් ඒ විසඳාගත යුතු ය. ඒ අතර ඊනියා දේශපාලන විසඳුම ගැන ද නැවත සිතා බැලිය යතු ය. කොටි පරදවන තෙක් වෙනත් දේශපාලන විසඳුමක් ගැන කතාකිරීම අනවශ්‍ය වෙයි. කොටි පැරදවීම ද එක්තරා දේශපාලන විසඳුමකි. ඒ විසඳුම පළමුව දිය යුතු ය. ඒ දීමෙන් පසුව දෙවැනි දේශපාලන විසඳුමක් ගැන කතා කළ හැකි ය. ඊනියා සටන් විරාම ගිවිසුම අද නිකම්ම නිකම් කොළ කැබැල්ලක් පමණකි. දෙවැනි දේශපාලන විසඳුමක් ගැන කතාකරන කාලයක එහි වැදගත්කමක් තිබිය හැකි ය. එහෙත් ඒ වන විට කොටි පරාජය වී ඇති බැවින් එවිට ද එහි වැදගත්කමක් නොතිබෙනු ඇත. අද ආන්ඩුවේ සම්පූර්ණ ශක්තිය යෙදවිය යුත්තේ දූෂණ අවම කර රටේ සංවර්ධනය ද සැලකිල්ලට ගනිමින් කොටි සංවිධනය මුළුමනින් පරාජය කිරීමට පියවර ගැනීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva